විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

මාධ්‍ය නිවේදනය

ශ්‍රී ලංකාව ආපදා සහන පිළිබඳ 24 වැනි ආසියාන් කලාපීය සංසදයේ අන්තර් සැසිවාර රැස්වීමේ සම-සභාපතිත්වය දරයි.

24 වැනි ආසියාන් කලාපීය සංසදයේ ආපදා සහන පිළිබඳ අන්තර්-සැසිවාර රැස්වීම (ARF ISM on DR) 2026 අප්‍රේල් මාසයේදී බංගලාදේශයේ සත්කාරකත්වයෙන් මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්විණි. එහිදී ශ්‍රී ලංකාව සහ වියට්නාමය බංගලාදේශය සමඟ සම-සභාපතිත්වය දැරීය.

ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සම සභාපති ධූරය හෙබවූ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ අග්නිදිග සහ මධ්‍යම ආසියානු අංශයේ අධ්‍යක්ෂ ජනරාල් චමරි රොද්‍රිගෝ මහත්මිය සිය ආරම්භක දේශනයේදී, ජාතික හැකියාවන් ශක්තිමත් කිරීමේ, සිවිල්-හමුදා සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීමේ, කලාපීය සහයෝගිතා යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීමේ සහ ආපදා ප්‍රතිචාර සඳහා තිරසර ප්‍රවේශයන් අනුගමනය කිරීමේ වැදගත්කම අවධාරණය කළාය. සම සභාපතිනිය ලෙස ඇය න්‍යාය පත්‍රයේ අයිතම දෙකක් සංවාදයට ලක් කළාය.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන්ගෙන් සමන්විත ශ්‍රී ලංකා දූත පිරිස, දිවිවා සුළි කුණාටුව අතරතුර ශ්‍රී ලංකාවේ අත්දැකීම් ඉස්මතු කරමින් ඉදිරිපත් කිරීම් දෙකක් ඉදිරිපත් කළහ. සිවිල්-මිලිටරි සහයෝගිතාව, ජාතික සහ ජාත්‍යන්තර සම්බන්ධීකරණය, මානුෂීය ආධාර සහ පශ්චාත් ආපදා ප්‍රතිසාධන ප්‍රයත්න කෙරෙහි මෙම ඉදිරිපත් කිරීම්වලදී අවධානය යොමු විය. වැඩිදියුණු කළ සම්බන්ධීකරණ යාන්ත්‍රණ සහ වඩාත් නම්‍යශීලී අරමුදල් ප්‍රවේශයන් හරහා ආසියාන් කලාපීය සංසදයේ රාමුව තුළ ආපදා ප්‍රතිචාර විධිවිධාන තවදුරටත් ශක්තිමත් කිරීමේ වැදගත්කම ශ්‍රී ලංකාවද අවධාරණය කළේය.

මෙම රැස්වීමේදී 2024–2027 වසර සඳහා ආපදා සහන පිළිබඳ ආසියාන් කලාපීය සංසදයේ වැඩ සැලැස්ම සමාලෝචනය කළ අතර, ශක්‍යතා ගොඩනැගීම, තාක්ෂණික නවෝත්පාදනය, තොරතුරු බෙදාගැනීම, පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සහ ආපදා කළමනාකරණයේ වැඩිදියුණු කළ කලාපීය සහයෝගිතාව කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් යෝජිත මැනිලා ක්‍රියාකාරී සැලැස්ම 2026–2036 පිළිබඳව සාකච්ඡා කළේය.

මෙය ශ්‍රී ලංකාව, බංගලාදේශය සහ වියට්නාමය විසින් සම සභාපතිත්වය දරන ලද, අඛණ්ඩව පැවැති තුන්වැනි සහ අවසන් අන්තර්-සැසිවාර රැස්වීමයි.

විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
කොළඹ

2026 මැයි 20 වැනි දින

Foreign Affairs
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்
Republic Building, Colombo 1
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
☎ 2 325 373/5, 2 207 200/7
cypher@mfa.gov.lk

Foreign Employment
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு
17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5
17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5
17 அவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 5
☎ 2 331 200
info@mfe.gov.lk

Tourism
සංචාරක
சுற்றுலாத்துறை
No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03,டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு(சர் ராசிக் ஃபரீத் மாவத்தை),கொழும்பு 1
☎ 2 381 798, 2 321 222
secretary@tourismmin.gov.lk